# සංස්කෘතික යටත්විජිතවාදයක ප්‍රතිඵලයක් නොවූ මහින්දාගමනය

මහාවිහාරය දකුණු ඉන්දීය භික්ෂූන් වහන්සේලා ආධිපත්‍යය දැරූ ඉන්දීය ගැති ආයතනයක්ය හා අභයගිරිය යනු දේශීය ආයතනයක් ය යන මතය පතුරුවා හැරීමට වෙහෙසෙන්නෝ බොහෝ වෙති. ඔවුන් එවැනි නිගමයකට එළඹෙන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයකි. ඇතැම්විට පස්වැනි හයවැනි සියවස්වල මහායානය මෙහි පැතිරවීමට උත්සාහ ගෙන ඒ ව්‍යවර්ථ වූ පසු මහාවිහාරයට පහරදීම ආරම්භ වන්නට ඇත. මහායානය පැතිරයෑම වැළැක්වූවෝ ආන්ද්‍ර ප්‍රදේශ භික්ෂූන් වහන්සේ සමග එක් වූ මහාවිහාරික භික්ෂූන් වහන්සේ ය. මහාවිහාරය හා ආන්ද්‍ර ප්‍රදේශ භික්ෂූන් වහන්සේ සම්බන්ධ වීම ඇතැමුන්ට විද දරාගැනීමට නොහැකි වන්නට ඇත.

අභයගිරිය පසු කලෙක කලා ශිල්පවලට වැදගත් තැනක් දී ඇති බව පැහැදිළි ය. මහාවිහාරය කලාවට පසු කලෙක එතරම් වැදගත් තැනක් නොදෙන්නට ඇත්තේ ථෙරවාදය ආරක්‍ෂාකිරීම තම ප්‍රධාන කාර්යය බවට පත්කර ගැනීමෙන් පසුව යැයි සිතිය හැකි ය. එහෙත් අපට අමතක වන කරුණ නම් අභයගිරියේ කලාවට රිසි සේ “ වර්ධනය ” වීමට ඉඩ දුණි නම් එය හින්දු කලාවකින් අවසන් වීමට ඉඩ තිබු බව ය. අජන්තා එල්ලෝරා චිත්‍ර අධ්‍යනය කළ ඇතැමුන්ගේ මතය වී ඇත්තේ ඒ චිත්‍රවල ථෙරවාදයෙන් මහායානයටත් මහායානයෙන් හින්දු ආගමටත් සිදු වූ ක්‍රමික වෙනසක් දැකිය හැකි බව ය.

අප කලින් ද සඳහන් කර ඇති පරිදි මහාවාහාරය නොවන්නට කලාවෙන් පමණක් නොව ආගමෙන් හා සංස්කෘතියෙන් ද සිංහලයන් හින්දූන් බවට පත්වීමේ ප්‍රවණතාවක් මෙරට තිබු බව ය. ඇතැම්විට එහි ප්‍රතිඵලයක් ලෙස සිංහල භාෂාව ද ද්‍රවිඩ රටාවක් සහිත භාෂාවක් හෝ ද්‍රවිඩ පවුලේ ම වූ භාෂාවක් හෝ වීමට තිබුණි. මෙරට නිර්මාණශීලීත්වයට යම් පසුබෑමක් අත්වුන ද, මහාවිහාරයේ ක්‍රියාකාරීත්වය හේතුකොටගෙන සිංහල ථෙරවාද බුදු දහම ඉතා ඉහළ මට්ටමකින් රැකගැනීමට අපට හැකි වී තිබේ.

මහාවිහාර භික්ෂූන් වහන්සේ සංස්කෘතික වශයෙන් ගත්කල අනුශාසකත්වයක් දැරූ බව අපි කීවෙමු. මෙය තවදුරටත් පැහැදිළි කළ යුතු ය. භික්ෂූන් වහන්සේ දේශපාලනයෙහි දී ද අනුශාසකත්වය දැරූහ. එහෙත් මේ  අනුශාසකත්ව දෙකෙහි ගුණාත්මක වෙනසක් විය. දේශපාලනයෙහි දී භික්ෂූන් වහන්සේ අනුශාසනය කළෝ රජවරුන්ට ය. එහි දී උන්වහන්සේ දඹදිව වෛදික රජවරුන්ගේ පුරෝහිතයන් මෙන් ක්‍රියා නො කළහ. පුරෝහිතයෝ බොහෝ විට බ්‍රාහ්මණයෝ වූහ. ඔවුහු රාජ සභාවේ අසුන් ගත්හ. රජුට අනුශාසනය කිරීමට පුරෝහිත බ්‍රාහ්මණයෝ රජ මැදුරට ගියහ. එහෙත් භික්ෂූන් වහන්සේ රජුට අනුශාසනය කිරීමට මාළිගාවට නො වැඩියහ. රජු අනුශාසනා ලබාගැනීමට විහාරයට පැමිණියේ ය.

මේ වෙනස බොහෝ දෙනාට අද තේරුම් ගැනීමට නොහැකිවීම කණගාටුවකි. එසේ වුවත් අමාරුවෙන් නමුත් සිංහල ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය කුමක් ද යන්න සිංහල බහුතරයට අවබෝධ කළ යුතු වෙයි. දේශපාලනයෙහි භික්ෂූන් වහන්සේගෙන් අනුශාසනය ලැබු රජවරු සුදුසු පරිදි ක්‍රියා කළහ. ඇතැම්විට රජවරු භික්ෂූන් වහන්සේ කී සියල්ලට අවනත නොවන්නත් ඇත. එහෙත් කිසිවකුට එහි ප්‍රශ්නයක් නො වී ය. රජුගේ වගකීම රට ආරක්‍ෂා කිරීම වීය. ඔහු එහි භාරකරු විය.

එහෙත් සංස්කෘතිය මුළුමනින් ම භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වය යටතේ ක්‍රියාත්මක විය. රටේ සංස්කෘතික ප්‍රතිපත්තිය තීරණය කෙරුණේ භික්ෂූන් වහන්සේ විසිනි. රජු එහි ක්‍රියාකාරකයෙක් නො වී ය. භික්ෂූන් වහන්සේ සංස්කෘතිය සම්බන්ධයෙන් ආධිපත්‍යයක් දැරී යැයි මෙයින් නො කියැවෙයි. අධිපතිවාදය යන්න සිංහල බෞද්ධ සංස්කෘතියට පටහැණි ය.  සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති මේ ලක්‍ෂණය වෙනත් සංස්කෘතියක දක්නට ඇතැයි සිතිය නො හැකි ය. ඒ රටවල පාලකයා (පාප් වහන්සේ හෝ රජු හෝ) සංස්කෘතියෙහි ද ආධිපත්‍යය දැරී ය. මෙරට රටේ ආරක්‍ෂාව හා පැවැත්ම පිළිබඳ දේශපාලන ප්‍රශ්නවල දී රජු භික්ෂූන් වහන්සේගේ අනුශාසකත්වයෙන් තීරණ ගත්තේ ය. එහෙත් සංස්කෘතික කටයුතුවල දී භික්ෂූන් වහන්සේ රජුගේ අවසරයක් නොපතා ම සාමූහික ව තීරණ ගත්හ.

© Prof. Nalin De Silva

එසේ සාමූහික ව තීරණ ගත් ප්‍රධාන ස්ථානය වූයේ මහාවිහාරය ය. එහි දී මහාවිහාරික භික්ෂූන් වහන්සේ තවත් සිංහල සංකල්පයක් අනුගමනය කිරීමෙන් පසුව මහාසම්මතයෙන්, එනම් ඒකමතිකව තීරණවලට එළඹුනහ. රජුට සංස්කෘතික වශයෙන් අනුශාසනය කිරීම මිහිඳු මහරහතන් වහන්සේගෙන් ද ඉගෙන ගත් කරුණකි. මිහිඳු මහා රහතන් වහන්සේ සංස්කෘතික වශයෙන් තීරණ ගෙන දේවානම්පිය තිස්ස රජුට දැන්වූහ.

ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව මෙරටට වැඩම කරවීම වේවා, මෙරට චෛත්‍ය තැනිය යුත්තේ කෙසේ ද කොතැනක ද යන්න වේවා රජුගේ කාර්යභාරය අර්ථදැක්වීම (භාරකරුවකු ලෙස රට රැකීම) වේවා මේ සියල්ල මිහිඳු මහා රහතන් වහන්සේගේ අනුශාසකත්වයෙන් සිදු කෙරිණි. එය ඉන්පසු මහාවිහාරයේ සම්ප්‍රදාය විය. අප මෙහි දී මතක තබාගත යුතු වැදගත් ම කරුණ නම් මිහිඳු මහා රහතන් වහන්සේ මෙරටට වැඩම කෙළේ ආක්‍රමණිකයකු ලෙස හෝ ආක්‍රමණිකයන් සමඟ හෝ නොවන බව ය. ඒ වැඩම කරවීම ධර්මාශෝක රජු හා දේවානම්පිය තිස්ස රජු අතර කෙරුණු පණිවුඩ හුවමාරුවකින් පසුව කල්තබා සැලසුම්කර කරන ලද්දක් බව පැහැදිලි ය. එසේ වුවත් ඇතැමුන් කීමට තැත්කරන පරිදි ඒ වැඩම කරවීම ලංකාව (සිංහලය) අශෝක රජුගේ යටත්විජිතයක් කිරීමේ අරමුණින් නොවූ බව නම් පැහැදිලි ය. මෙරට රජවරු අශෝක රජුගෙන් පැවත ආ රජවරුන්ගේ යටත් රජවරු නො වූහ.

එසේ යටත්විජිතයක් කිරීමේ අරමුණින් මිහිඳු හිමිපාණන් වහන්සේ මෙරටට වැඩම කළ බව කීමට උත්සාහ දරන්නේ බටහිරයන් හා ඔවුන්ගේ ආවතේවකරුවන් වීම පුදුමයක් නො වෙයි. බටහිරයෝ යටත්විජිතවාදීන් ලෙස මෙරටට ක්‍රිස්තියානි (පළමුව කතෝලික) ආගම, යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ගෙන ආවෝ ය. ඔවුන්ට බුදුදහම හා බෞද්ධ සංස්කෘතිය ද යටත්විජිතවාදයක ප්‍රතිඵලයක් ලෙස මෙරටට ගෙන ආ බව පෙන්වීමට අවශ්‍ය වී ඇත. ඔවුන් එහි දී ගෙන එන ප්‍රධාන ම හා එක ම තර්කය දේවානම්පිය තිස්ස රජු දෙවැනි වරට ද අභිෂේක කරවීම ය.

මේ අභිෂේකය දඹදිවින් පැමිණි නියෝජිතයකුගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරී නැත. මිහිඳු මහා රහතන් වහන්සේ එයට සම්බන්ධ වී නැත. ඇතැම්විට එය මේ කලාපයේ තිබූ චාරිත්‍රයක් වෛදික චාරිත්‍ර කිහිපයක් ද එකතු කරගනිමින් නැවත ආරම්භ කිරීමක් විය හැකි ය. අප රට බෞද්ධ වීම යනු ක්‍රිස්තියානිය, මාක්ස්වාදය වැනි ආගන්තුක ධර්මයක් මෙරටට හඳුන්වා දීමක ප්‍රතිඵලයක් නොවන බව අපි කියා ඇත්තෙමු. යක්ෂයන් හා ආර්යයන් දඹදිවට හා ලංකාවට පැමිණීමට පෙර මේ කලාපයේ තිබූ චින්තනයෙන් හා සංස්කෘතියෙන් බිහිවූ දහමක් නිල වශයෙන් හඳුන්වාදීම මිහිඳු මහා රහතන් වහන්සේ විසින් සිදු කෙරී ඇත.

අපි ඉතා කෙටියෙන් ඒ සංසිද්ධිය මෙතෙක් සඳහන් කර ඇති කරුණු හා තවත් කරුණු ද ඇතුළත් කර නැවතත් සඳහන් කරමු. මේ කලාපයෙහි, එනම් උතුරින් චීනයේ සිට දකුණින් ලංකාව දක්වා තිබූ සංස්කෘතිය හා චින්තනය (ඇතැම් විට සුළු සුළු වෙනස්කම් සහිතව) යක්ෂයන්ගේ හා ආර්යයන්ගේ පැමිණීමෙන් පසුව වෙනස් වී ඇත. යක්ෂයෝ ජනවර්ගයක් වූහ. එහෙත් ආර්යයෝ සංස්කෘතික කණ්ඩායමක සාමාජිකයෝ වූහ. මේ දෙපිරිසම දඹදිවට පැමිණ ඇත්තේ පර්සියාවේ හා එයට නුදුරු බටහිර ප්‍රදේශයක සිට බව පිළිගත හැකි ය. එයට අමතර ව ද්‍රවිඩයන් ද දඹදිවට පැමිණ ඇත. ද්‍රවිඩයන් පැමිණ ඇත්තේ බටහිර ආසියාවේ යම් ප්‍රදේශයක සිට බවත් ක්‍රිස්තු පූර්ව එක්දහස් පන්සීයේ දී පමණ පැමිණ ඇති ආර්යයන් පැමිණීමෙන් බොහෝ කලකට පසුව ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ පමණ බවත් ඇතැම් ඉතිහාසඥයෝ පවසති. එයට අමතරව ද්‍රවිඩයන් අප්‍රිකාවේ සිට පැමිණි බවට ද මතයක් වෙයි. කොතැනින් පැමිණිය ද ඒ පැමිණි ගමනේ දී ඔවුන් වර්තමාන පකිස්ථානය අසළ බෲහි ප්‍රදේශයෙහි නැවතී සිටි බවට සාක්ෂි ඇති බව සුප්‍රකට ඉතිහාසඥයකු වූ නිලකණ්ඨ ශාස්ත්‍රී මහතා සඳහන් කරයි. අදත් බෲහි ප්‍රදේශයෙහි ද්‍රවිඩ පවුලට අයත් භාෂාවක් කතාකරන ජනතාව වාසය කරති.

මේ තුන් පිරිසම හිමාලය කඳු වැටියෙන් දකුණු දෙසට පමණක් පැමිණ ඇත. හිමාලයෙන් උතුරට ගමන් කිරීම දුෂ්කර වීම එයට හේතුව වූවා නිසැක ය. තෙපිරිසෙන් පළමුව දඹදිවට පැමිණ ඇත්තේ ආර්යයන් විය හැකි ය. යක්ෂයන් ආර්යයන්ට පසුව දඹදිවට පැමිණියත් ආර්යයන් (අර්ධ වෛදිකයන්) පැමිණීමට පෙර ලංකාවට පැමිණ ඇති බව පැහැදිලි ය. සමහර විට යක්ෂයන් එකම වකවානුවේ දී දඹදිවට හා ලංකාවට පැමිණෙන්නට ඇත. යක්ෂයන් පැමිණ

© Prof. Nalin De Silva

ඇත්තේ ගෝත්‍රික පිරිසක් ලෙස යැයි සිතිය හැකි ය. මේ ගෝත්‍රිකයන් තමන් පැමිණි දේශයේ සංස්කෘතිය සමග බද්ධ වී නව සංස්කෘතියක් ගොඩනැගීමට උත්සාහ ගත්ත ද ඔවුන් අනෙක් අයගෙන් වෙන් ව වාසය කළ බවක් පෙනෙන්නට ඇත. ඔවුන් තමන්ගේ ම වූ අනන්‍ය සංස්කෘතියක් නොනැසී පැවැතීම සඳහා උත්සාහ ගෙන ඇති බව පෙනෙයි. මෙහි දී කියා ඇත්තේ අනන්‍ය සංස්කෘතියක් නොනැසී පවත්වාගෙන යෑම මිස සංස්කෘතියක් නොවෙනස්ව පවත්වාගෙන යෑම නොවන බව අවධාරණය කළ යුතු ය. සංස්කෘතික පැවැත්ම සම්බන්ධයෙන් යක්ෂ ගෝත්‍රිකයන් හා යුදෙව් ගෝත්‍රිකයන් අතර සමීපත්වයක් වෙයි. යුදෙව්වෝ ලෝකයේ කොතැනට විසිරී ගියත් තම අනන්‍ය සංස්කෘතිය පවත්වාගෙන යෑමට කටයුතු කළහ.

ලංකාවට යක්ෂ ගෝත්‍රිකයන් මුලින් ම පැමිණියේ කෙදිනක දැයි කීමට අපි නො දනිමු. එහෙත් ඔවුන් තම සංස්කෘතියෙහි තිබූ යම් තාක්ෂණයක් මෙරටට ගෙනැවිත් ඇත. ඒ තාක්ෂණයේ ආධාරයෙන් මෙරට වැව් නිර්මාණය කර ඇත්තේ යක්ෂ ගෝත්‍රිකයන් යැයි කිව හැකි ය. අදත් යකුන් බැඳි වැව් ගැන අපි කතාකරමු. ඔවුන්ගේ තාක්ෂණය අදත් අප අගය කරන්නේ ඒක යකාගෙ වැඩක් යැයි කියමිනි. යකා බැඳගෙන වැඩ ගැනීම යකෙක් කන්න බඩගිනියි ආදියෙන් පැහැදිළි වන්නේ යක්ෂ ගෝත්‍රිකයන් දක්ෂ ශ්‍රමිකයන් වූ බව හා සාමාන්‍ය ප්‍රමාණයට වඩා ආහාර අනුභව කළ බව ය. යක්ෂයන්ට වැව් නිර්මාණය කිරීමට තරම් තාක්ෂණයක් තිබෙන්නට ඇති මුත් ඔවුන් ලංකාවට පැමිණීමට පෙර වැව් නිර්මාණය නොකෙළේත් දඹදිව වුව ද ඒ කටයුත්තට අත නො ගැසුවේත් ඇයි ද යන ප්‍රශ්නය අප හමුවේ වෙයි.

වැවක් පමණක් නොව වෙනත් යමක් නිර්මාණය කිරීමට ද තාක්ෂණයක් මෙන් ම සංස්කෘතියක් හා චින්තනයක් අවශ්‍ය වෙයි. තාක්ෂණය තිබූ පමණින් ම යමක් නිර්මාණය කළ නො හැකි ය. එයට අවශ්‍ය චින්තනය ද තිබිය යුතු ය. වැව් නිර්මාණය සඳහා අවශ්‍ය චින්තනය තිබියේ ලංකාවේ බව පැහැදිළි ය. අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර මෙරටට යක්ෂ ගෝත්‍රිකයන් පැමිණීම මෙහි දී වැදගත් වූවාට සැකයක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva